සැ. යු.– 2007.01.26 දින පළවූ අංක 1,482 දරණ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,483 - 2007 පෙබරවාරි 02 වැනි සිකුරාදා - 2007.02.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 76 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 78 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 76 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 79 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 පෙබරවාරි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජනවාරි මස 26 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එව්ය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ශ්‍රී ලංකා දුම්රිය සේවයට තද ලීයෙන් තැනූ සිල්පර කඳන් (Hardwood sleepers) 1,00,000 ක් සැපයීම

ටෙන්ඩර් අංකය : එස්. ආර්. එස්./එෆ් 6491.

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයට තද ලීයෙන් තැනූ සිල්පර කඳන් 1,00,000ක් සැපයීම සඳහා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් සැපයුම්කරුවන්ගෙන් හෝ ඔවුන් විසින් ඇටෝර්නි බලය පවරන ලද ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි නියෝජිතයන්ගෙන් භාරගනු ලබයි.

02. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය 2007.03.02 දින ප. ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) වේ.

03. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දරන ලිපිනයේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙත හෝ පිටරටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත 2007.01.18 සිට 2007.02.14 දක්වා සතියේ වැඩ කරන දිනවලදී පෙ. ව. 9.30 සිට ප. ව. 3.30 දක්වා ආපසු නොගෙවනු ලබන රු. 10,000 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් හෝ ඒ සමාන විදේශ මුදල් ප්‍රමාණයක් ගෙවා ලබාගන්නා ලද ආකෘති මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

04. ටෙන්ඩර් පත් විවෘත කිරීම, ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ විගස ශ්‍රී ලංකාව, කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 1 දරන ස්ථානයේ පිහිටි දුම්රිය හා ගමනාගමන අමාත්‍යාංශයේ දී සිදුකෙරේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට සහභාගිවීමට අවසර දෙනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ හැකිය.

සභාපති, අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව, ලේකම්, දුම්රිය හා ගමනාගමන අමාත්‍යාංශය බාරේ, අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

ලියාපදිංචි තැපෑලේ දී සිදුවන තැපැල් ප්‍රමාදයන් සඳහා දුම්රිය හා ගමනාගමන අමාත්‍යාංශය හෝ දුම්රිය දෙපාර්තමේන්තුව වගකීම භාරගනු නොලැබේ.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ටෙන්ඩර්පත් අය කිරීමකින් තොරව පරීක්ෂා කළ හැකිය.

07. වැඩි විස්තර සඳහා. දුම්රිය ගබඩා අධිකාරී, දුම්රිය ගබඩා උප දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2432044 හෝ 94 (11) 2436818 අමතන්න.

සභාපති,
අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව.

02-163

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - කොළඹ කොටුව

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවල රාජසන්තක කරනු ලැබූ සහ හිමිකරුවන් හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයාගත නොහැකි වූ නඩු භාණ්ඩ 2007.02.24 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියෝග කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා පුද්ගලයන් තම හැඳුනුම්පත ගෙන ආ යුතුය.

මහෙස්ත්‍රාත් - කොළඹ කොටුව.

2007 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### භාණ්ඩ ලැයිස්තුව

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | 84041 | රන් මාල | 01යි |
| 02. | 84039 | රන් මාල | 01යි |
| 03. | 84038 | රන් මාල | 01යි |
| 04. | 82872 | රන් මාල කෑබලි | 01යි |
| 05. | 82604 | රන් මාල | 01යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 06. | 80926 | රන් මාල | 01යි |
| 07. | 78600 | රන් කැබලි | 01යි |
| 08. | 78696 | රන් කැබලි | 01යි |
| 09. | බී 140/06 | රන් පාට මාල කොටස් | 01යි |
| 10. | ඒ. ආර්. 28331 | රන් පාට | 01යි |
| | | ගල් සහිත පෙන්ඩන්ට් | 01යි |
| 11. | ඒආර්/25418 | රන් පාට මාල | 01යි |
| 12. | ඒ.ආර්./25419 | රන් පාට මාල | 01යි |
| 13. | 82606 | රන් මාල | 01යි |
| 14. | 81727 | රන් මාල | 01යි |
| 15. | 78406 | රන් ගුලි | 01යි |
| 16. | 78332 | රන් මාල | 01යි |
| 17. | 82537 | රන් ගුලි | 01යි |
| 18. | අංක රහිත | 585431 - පාපැදි | 01යි |
| 19. | 79008 | අංක 55530058 - පාපැදි | 01යි |
| 20. | අංක රහිත | 417830 පාපැදි | 01යි |
| 21. | අංක රහිත | පාපැදි | 01යි |
| 22. | අංක රහිත | පාපැදි | 01යි |
| 23. | අංක රහිත | රැලේ ස්පෝට් පාපැදි | 01යි |
| 24. | අංක රහිත | පාපැදි | 01යි |
| 25. | බී 556/03 | මවුන්ටන් පාපැදි | 01යි |
| 26. | අංක රහිත | යූ. එස්. 94173 -මවුන්ටන් පාපැදි | 01යි |
| 27. | අංක රහිත | සීසී 158860 පාපැදි | 01යි |
| 28. | ඒආර්. 27736 | 5607689 ලුමාලා පාපැදි | 01යි |
| 29. | අංක රහිත | 55571210 ලුමාලා පාපැදි | 01යි |
| 30. | අංක රහිත | එල්එම් 12577-පාපැදි | 01යි |
| 31. | ඒආර්./25238 | 55571210 ලුමාලා පාපැදි | 01යි |
| 32. | අංක රහිත | මවුන්ටන් පාපැදි | 01යි |
| 33. | අංක රහිත | කෙන්ස්ටන් මවුන්ටන් පාපැදි | 01යි |
| 34. | අංක රහිත | ළමා පාපැදි | 01යි |
| 35. | අංක රහිත | ළමා පාපැදි | 01යි |
| 36. | ඒ. ආර්. 25478 | 55703802 ලුමාලා පාපැදි | 01යි |
| 37. | ඒ. ආර්./26633 | ළමා පාපැදි | 01යි |
| 38. | ඒ. ආර්./28367/06 | මවුන්ටන් පාපැදි | 01යි |
| 39. | ඒආර්. 28366/06 | ස්පෝර්ට්ස් වර්ගයේ පාපැදි | 01යි |
| | | රැලේ වර්ගයේ පාපැදි | 01යි |
| | | හීරෝ වර්ගයේ පාපැදි | 01යි |
| | | ජීනික්ස් වර්ගයේ පාපැදි | 01යි |
| | | සිනෝර් වර්ගයේ පාපැදි | 01යි |
| 40. | අංක රහිත | එරික්ෂන් ජංගම දුරකථනය | 01යි |
| 41. | බී 894/06 | ඇල්කටෙල් වර්ගයේ ජංගම දුරකථනය | 01යි |
| 42. | ඒ.ආර්./27821 | මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථනය | 01යි |
| 43. | ඒ. ආර්./27822 | නොකියා වර්ගයේ ජංගම දුරකථනය | 01යි |
| 44. | ඒ. ආර්./87823 | නොකියා වර්ගයේ ජංගම දුරකථනය | 01යි |
| 45. | 77006 | නොකියා වර්ගයේ ජංගම දුරකථනය | 01යි |
| | | දුරකථන රඳවන | 01යි |
| | | දුරකථන බැටරි චාජර් | 02යි |
| 46. | බී.67/06 | ඇල්කටෙල් වර්ගයේ ජංගම දුරකථනය | 01යි |
| | | නොකියා වර්ගයේ ජංගම දුරකථනය | 01යි |
| | | පිලිප්ස් වර්ගයේ ජංගම දුරකථනය | 01යි |
| | | නොකියා වර්ගයේ ජංගම දුරකථනය | 01යි |
| | | සෝනි එරික්ෂන් | 01යි |
| | | සෝනි එරික්ෂන් | 01යි |
| | | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| | | සම්සුයින් වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| | | එරික්ෂන් වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| | | මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| | | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| | | මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| | | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| | | සම්සුයින් වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| | | සිනෙට් වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| | | වාහන කැසට් යන්ත්‍ර | 01යි |
| | | පිරිමි අත්ඔරලෝසු | 05යි |
| | | දුරකථන චාජර් | 10යි |
| 47. | 86972 | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| 48. | අංක රහිත | විදුලි පන්දම් (එවරෙඩි) | 06යි |
| 49. | 48900 | වාහන සංඥා පහන් | 02යි |
| 50. | ඒ. ආර්. 27549 | අඩි 18 ක් දිග ගැල්වනයිස් බට(අඟල් 2 1/2) | 18යි |
| 51. | 86737 | ප්ලාස්ටික් ගමන් මලු | 01යි |
| 52. | ඒ. ආර්.27935 | ඩී. වී. ඩී. යන්ත්‍ර (දුරස්ථ පාලක සමග ) | 01යි |
| 53. | ඒ.ආර්. 27027 | විවිධ ද්‍රව්‍ය අඩංගු ගමන් මලු | 01යි |
| 54. | ඒ.ආර්. 28186 | වාහන ජැක් | 01යි |
| 55. | 64357 | ඇලුමිනියම් බියර් පීප්ප | 01යි |
| 56. | ඒ. ආර්. 26689 | සුදු පාට පීරිසි | 02යි |
| | | කොළ පාට මල් සහිත පීරිසි | 01යි |
| | | නිල් කැටයම් සහිත පීරිසි | 02යි |
| | | බිත්තරය හැඩැති ලොකු පීරිසි | 01යි |
| | | කුඩා කෝප්ප | 01යි |
| | | සිගරට් අළු බඳුන | 01යි |
| 57. | අංක රහිත | වාහන ජැක් | 02යි |
| 58. | 66092 | වාහන ජැක් | 01යි |
| 59. | ඒ.ආර්./28365 | යකඩෙන් තනන ලද වෙළඳ කුටියක් | |
| 60. | 85026 | ඒ 4 පොටෝකොපි බන්ඩල් | 05යි |
| 61. | 78267 | කුඩා කැසට් යන්ත්‍ර | 01යි |
| | | බිත්ති ඔරලෝසු | 01යි |
| 62. | 82815 | සෙරෙප්පු ජෝඩු | 01යි |
| 63. | 61770 | අබලන් විදුලි ස්ත්‍රික්ක | 01යි |
| 64. | අංක රහිත | මධ්‍යම ප්‍රමාණයේ යකඩ මිටි | 01යි |
| 65. | 80120 | පරිගණක මොනිටර් | 01යි |
| | | පරිගණක සී. පී. යූ. කොටස් | 01යි |
| 66. | ඒආර්. 27494 | අඟල් 3/4 ගැල්වනයිස් බට | 10යි |
| 67. | බබී/413/06 | පලංචි කණු | 03යි |
| 68. | 64732 | ඩී. වී. ඩී. කවර | 54යි |
| 69. | අංක රහිත | රබර් කුට්ටියක් | |
| 70. | 64733 | ලොකු පුනීල | 01යි |
| 71. | අංක රහිත | ප්ලාස්ටික් රවුම් | 09යි |
| 72. | 79601 | යකඩ බාල්දි | 01යි |
| 73. | අංක රහිත | යකඩ පෙට්ටි | 01යි |
| 74. | අංක රහිත | ගෑස් උදුනක කොටස් | 02යි |
| 75. | අංක රහිත | රබර් ෂීට් | 03යි |
| 76. | 64421 | ගමන් මලු | 12යි |
| 77. | 64422 | ගමන් මළු | 05යි |
| 78. | 64750 | ගමන් මළු | 08යි |
| 79. | 64751 | ගමන් මළු | 08යි |
| 80. | 64752 | ගමන් මළු | 03යි |
| 81. | 64753 | ගමන් මළු | 18යි |
| 82. | ඒ.ආර්. 24414 | කුඩා තරාදි | 01යි |
| | | පඩි සෙට් | 01යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 83. | අංක රහිත | විවිධ සෙල්ලම් බඩු උර | 01යි |
| 84. | 61115 | චාජර් විදුලි පහන් | 01යි |
| 85. | අංක රහිත | විවිධ සුභ පැතුම් පත් අඩංගු පෙට්ටි | 01යි |
| 86. | අංක රහිත | ඔලිම්පියා ඉංග්‍රීසි යතුරුලියන | 01යි |
| 87. | 62705 | රබර් පාපිස්නා | 01යි |
| 88. | අංක රහිත | කුඩා හම් බෑග් | 03යි |
| | | ඉන පටි හිල් විදින අඩු | 01යි |
| 89. | ඒ. ආර්. 158/03 | කුඩාකැසට් රෙකෝඩර් | 01යි |
| | | විදුලි ස්ත්‍රික්ක | 01යි |
| | | කුඩා කැමරා | 01යි |
| | | වෝක් මන් කැසට් යන්ත්‍ර | 01යි |
| | | සී. ඩී. ධාවන යන්ත්‍ර | 01යි |
| 90. | අංක රහිත | කුඩා වූල් බෑන්ඩ් අඩංගු උර | 01යි |
| 91. | අංක රහිත | ප්ලාස්ටික් මල් වට්ටි | 18යි |
| | | ප්ලාස්ටික් ට්‍රේ | 26යි |
| 92. | 64840 | කැන්වස් රෙදිවලින් සෑදූ ඉන පටි | 110යි |
| 93. | 64838 | ලොකු පින්තූර | 05යි |
| | | පොඩි දින දර්ශන | 06යි |
| | | මුදල් පසුම්බි | 10යි |
| | | හිස පීරන පනා | 10යි |
| | | පොඩි දින පොත් | 08යි |
| | | හැඳුනුම්පත් කවර | 09යි |
| 94. | 64846 | සුදු පාට බැනියම් | 12යි |
| 95. | 64847 | අව් කණ්නාඩි | 06යි |
| 96. | 64848 | පොඩි හැඳි | 06යි |
| | | ප්ලාස්ටික් විසිල් | 18යි |
| 97. | 64849 | අත් ග්ලවුස් | 18යි |
| 98. | 57613 | ගෝල්ඩ් ස්ටාර් වර්ගයේ රූපවාහිනී | 01යි |
| 99. | 83636 | සෝනි වීඩියෝ කැමරා | 02යි |
| | | කාන්තා (ළමා) පාවහන් යුගල | 02යි |
| 100. | ඒආර්/28368 | රීප්ප අඩි 150ක් පමණ | |
| | | විවිධ දිග හා පළල ඇති ලෑලි | 22යි |
| | | විවිධ දිගින් යුත් අහලේ ඇලුමිනියම් බට | 13යි |
| | | බට රඳවන | 08යි |
| | | වී හැඩයෙන් යුත් බට | 01යි |
| 101. | අංක රහිත | නිල් පාට දිග කලිසම් | 52යි |
| 102. | අංක රහිත | පිරිමි පාවහන් යුගල | 01යි |
| 103. | ඒ.ආර්. 22234 | සන්යෝ අබලන් කැසට් යන්ත්‍ර | 01යි |
| 104. | ඒ. ආර්. 22283 | මෝටරෝලා ජංගම දුරකථන | 01යි |
| 105. | ඒ. ආර්.22286 | සැම්සුයින් ජංගම දුරකථන | 01යි |
| 106. | 648835 | සෙල්ලම් කාර් 04ක් අඩංගු කාඩ් | 01යි |
| | | සෙල්ලම් වෛද්‍ය උපකරණ කට්ටල කාඩ් | 01යි |
| 107. | 64836 | පොඩි බෑග් | 05යි |
| | | රෙදි බෑග් | 05යි |
| 108. | 83559 | ඇලුමිනියම් ලොකු තාච්චි | 02යි |
| | | ඇලුමිනියම් මධ්‍යම ප්‍රමාණයේ තාච්චි | 01යි |
| | | ඇලුමිනියම් නැඹිලි | 02යි |
| | | ඇලුමිනියම් කුඩා මැටි කෝප්ප | 01යි |
| | | මධ්‍යම ප්‍රමාණයේ සාස් පාන් | 01යි |
| | | මධ්‍යම ප්‍රමාණයේ ඇලුමිනියම් මුට්ටි | 02යි |
| | | කුඩා ඇලුමිනියම් මුට්ටි | 01යි |
| 109. | අංක රහිත | යකඩ පෙට්ටි | 01යි |
| 110. | අංක රහිත | යකඩ පෙට්ටි | 01යි |

02-127

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

රත්මලාන, බොරුපන පාර, 10 වන පටුමගේ, අංක 237හි පදිංචි ලසන්තා මානෙල් මාරපන වන මම රත්මලාන, බොරුපන පාර, 10 වන පටුමගේ, අංක 237 හි පදිංචි වික්‍රමසිංහ සේනානායක අප්පුහාමිලාගේ තිලකා රත්නාවලී රාජපක්ෂ යන අය මගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරමින් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ධම්මික ඩී. යාපා මහතා සහතික කළ අංක 2956 හා 2004.12.26 දින දරන ඇටර්නි බලපත්‍රය අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. තවද එකී බලපත්‍රය යටතේ මින් ඉදිරියට ඇය විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වග නොකියන බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

ලසන්තා මානෙල් මාරපන.

අංක 237,
10 වන පටුමග,
බොරුපන පාර, රත්මලාන.

02-17

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

රාගම, බටුවත්ත අංක 140 ඒ, හි ස්ථිර පදිංචිය ඇති දැනට කැනඩාවේ ඔන්ටාරියෝ ප්‍රාන්තයේ බ්‍රැම්ප්ටන්,බන්චිබෙරි-වේ, අංක 88 හි පදිංචිව සිටින එදිරිසූරි මොහොට්ටිගේ දීපාල් ආටිගල සේරම් වන මම මහජනතාවට මෙයින් දන්වා සිටින්නේ කොළඹ කලාපයේ ප්‍රසිද්ධ නොතාරිස් දේශානන්ද බණ්ඩාර බුලත්ගම මහතා විසින් ලියා සහතික කල 1998 ජූලි මස 28 දිනැති අංක 330 දරන, කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ලේඛන ලියාපදිංචි කිරීමේ බලයලත් ලේඛනයේ 182 පිටුවේ, 81 දරන පත්ඉරුවේ අංක 5779 සහ 1998.08.03 දිනැතිව ලියාපදිංචි කර ඇති මා විසින් රාගම, බටුවත්ත අංක 140/ඒ, හි පදිංචි එදිරිසූරි මොහොට්ටිගේ මෝසෙස් සේරම් යන අය වෙත දී ඇති ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවය.

මෙම දැන්වීම ප්‍රචාරය වන දින සිට ඉදිරියට එකී මගේ ඇටෝර්නි බලකරු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ගණුදෙනුවකට හෝ වෙන යම් බැඳීමකට මා විසින් වගකීමක් නොදරන බවද වැඩි දුරටත් මෙයින් දැනුම් දී සිටිමි.

එදිරිසූරි මොහොට්ටිගේ දීපාල් ආටිගල සේරම්.

02-03

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 109, ගිරිඋල්ල පාර මීරිගම පදිංචි බස්තියන් කෝරාලලාගේ ඉරේෂා ශ්‍යාමලී රොඩ්‍රිගෝ වන මම අංක 109 ගිරිඋල්ල පාර, මීරිගම පදිංචි ලියන ලේකමලාගේ චන්ද්‍රා අයිරාංගනී රොඩ්‍රිගෝ යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරමින් ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. ගුණරත්න මහතා සහතික කළ අංක 8973 සහ 1997.04.02 දරන ඇටර්නි බලපත්‍රය අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. තවද එකී බලපත්‍රය මගින් මින් ඉදිරියට ඇය විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වගකියනු නොලබන බවට වැඩි දුරටත් ප්‍රකාශ කරමි.

බී. කේ. ඉ. එස්. රොඩ්‍රිගෝ,

ගිරිඋල්ල පාර, මීරිගම.

02-150

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## මහජන බැංකුව– වත්තල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රාගම, පේරලන්ද පාර හි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි නිවසක් සහිත පර්චස් විසිහයයි දශම පහයි තුන (අක්කර 0, රූඩ් 0, පර්චස් 26.53) ක ඉඩම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්, 2007.02.22 වන දින පෙ.ව. 11.0 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2002.12.05 දිනද, ඬේලිනිවුස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත්වල 2002.11.21 දිනද, පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* - කඳාන පේරලන්ද පාරේ, ගොස් දකුණු පසට ඇති පොඩි වී කුඹුර පාරේ (පේරලන්ද දුම්රියපල අසලින් විහිදී යන) මී.500 ක් පමණ ගිය විට අදාළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයේ රු. 500 ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මුදුන්ගොඩ, බැලුම්මහර නුවර පාර, අංක 131, මහජන බැංකුව, බටහිර කලාප 111 කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරි වෙත ගෙවිය යුතුය.

දුරකතන අංකය :033-2222325, 033-2225008, 033-2226741.
ෆැක්ස් අංකය :033-2226165.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ISO 9001-2000 සහතිකය ලත් පිළිගත්
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.
අපගේ සේවාව දීප ව්‍යාප්ත සේවාවකි.

*ප්‍රධාන කාර්යාලය*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකතන : 081-2227593.
ටෙලි/ෆැක්ස් : 081-2224371.

*නව නාගරික කාර්යාලය*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකතන : 011-2502680/011-258408.
ටෙලි/ෆැක්ස් :011-2588176.
Email: samera@sri.lanka.net.

02-89

---

## මහජන බැංකුව– වත්තේගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මධ්‍යම පළාත, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පල්ලේගම්පහ පත්තුවේ වත්තේගම පිහිටි ගෙදර කුඹුර වත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සංගරදෙනිය මහතා විසින් අතුරු බෙදීමක් වශයෙන් මැන සකසූ අංක 4096 සහ 2004.01.02 දින දරන පිඹුරේ ලොට් 4-බී දරන රූඩ් එකයි පර්චස් දහයක් (අක්කර 0, රූඩ් 01, පර්චස් 10) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය මත අප විසින් 2007.02.26 වන දින පෙ.ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2005.10.28 වන දින ද, දිනමිණ, ඬේලි නිවුස් සහ තිනකරන් යන පුවත්පත්වල 2005.10.14 වන දින ද පලකර ඇති දේපළ වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– වත්තේගම නගරයේ සිට උඩුරාවන මාර්ගයේ නගර සභා ක්‍රීඩා පිටිය පසු කළ විට දකුණු පසින් ඉහත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මහජන බැංකුව මහනුවර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතුය.

දුරකතන අංකය : 081-2234283
ෆැක්ස් අංකය : 081-2223017.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බලයලත්
වෙන්දේසිකරුවෝ (රාජ්‍ය හා
පෞද්ගලික බැංකුකරුවන්
වෙනුවෙන්)සහ උසාවි කොමසාරිස්වරු.)

*ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය,*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකතන අංක: 081-2224371/081-2227593
ෆැක්ස් : 081-2224371.

*නව නාගරික කාර්යාලය සහ වෙන්දේසි ශාලාව*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
011-2585408/011-2502680.
011-2588176.
ඊමේල් : **Samera @ sri lankanet**

02-100

---

## සීමාසහිත සෙලාන් බැංකුව - පානදුර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 04 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මුනවත්තබාගේ පත්තුවේ රයිගම් කෝරලේ පරගස්තොට පිහිටි බලය ලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් සාදන ලද 1998.02.02 දිනැති අංක 347 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් කැබලි අංක බී වශයෙන් ලකුණු කල ගොන්නගහවත්ත කොටසක් *හෙවත්* පුවක්වත්ත නැමැති අක්කර එකක් (අක්. 01, රූ. 0, පර්. 0) විශාල ඉඩම. (මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව ඩී 91/279 හි ලියාපදිංචි කර ඇත)

ඉහත විස්තර කරන ලද එකී අංක 347 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැබලි අංක බී ලකුණු කල පෙර කී ඉඩම් කොටස පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලේ මුනවත්තබාගේ පත්තුවේ පරගස්තොට පිහිටි ගොන්නගහවත්ත *හෙවත්* පුවක්වත්ත නැමැති අක්කර තුනයි රූඩ් දෙකක් වූ ඉඩමෙන් නොබෙදූ අක්කර එකක් ලකුණු කල ඉඩම් කොටස, මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව ඩී 91/199 හි ලියාපදිංචි කර ඇත.

මෙම දේපළ වාද්දුව පදිංචි හෙට්ටි කංකානම්ගේ මහීපාල පෙරේරා සහ හෙට්ටි කංකානම්ගේ කීර්තිපාල පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ 2007 පෙබරවාරි මස 20 දින පෙ.ව.11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2006.06.09 දින ද, ලංකාදීප සහ ඩේලිමිරර් යන පුවත්පත් වල 2006.04.27 වන දින ද වීරකේසරි පුවත්පතේ 2006.05.11 වන දින ද පළ වී ඇත.

*දේපළට පිවිසීම.*– මොරන්තුඩුව සිට මිල්ලනියිය පාරේ කි. මී. 2.5 ක් ගිය විට ඇති පරගස්තොට හංදියෙන් තවත් මීටර් 100 ක් ඉදිරියට ගිය විට හමුවන වම් පස ඇති බොරළු දැමූ ප්‍රාදේශීය සභා පාරෙන් මීටර් 300 ක් ඉදිරියට ගිය විට දකුණු පස ඇති අඩි 20 ක් පළල පාර සැලැස්මේ පෙන්නුම් කරන පරිදි ඉඩමට යෑම සඳහා ඇති මාර්ගය වේ.

*ගෙවීමේ ක්‍රමය.*– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය. 1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්) 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500 6. සියළුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති) සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ. දුරකතනය : 011-2456258, 2456263, 2456284

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

ටී. ඇන්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011-2696155, 011-2572940.

02-64

## මහජන බැංකුව - මීගමුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මීගමුව කදිරාන පිහිටි, විශාලත්වය රූඩ් 02, මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.02.15 දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2006.10.27 දිනද, දිනමිණ, සහ ඩේලිනිව්ස් පුවත්පත්වල 2006.10.09 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම.– දිවුලපිටිය කුරුණෑගල පාරේ ගිරිඋල්ල නගරයට පිවිසීමට සැතපුම් 01 ක් පමණ පෙරාතුව හමුවන නාල්ල ග්‍රාමයේ ප්‍රසිද්ධ පාරට මායිම්ව වම්පසින් ඇති මහමාරුවත්ත මැදින් දිවෙන අතුරු පාරේ යාර 100 ක් පමණ ගිය පසු දකුණු පසින් දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.– වෙන්දේසි අවසානයේ සාර්ථ ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,
7. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකතන අංක :032-2253301, ෆැක්ස් අංක :032-2255247/032-2253300.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවී මට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර, මීගමුව.
දුරකතන අංක 031-2223219.

02-82

## සෙලාන් බැංකුව - ගම්පහ ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

#### පදිංචියට සුදුසු දේපළක්

ගම්පහ ප්‍රාදේශීය සභා හෙනරත්ගොඩ උප කාර්යාල සීමාවන් තුළ මොරගොඩ ගමේ බණ්ඩාරනායක මාවතට ඔබ්බෙන් පිහිටි "ගොන්නගහවත්ත" නැමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 42.03.

මෙම දේපළ ගම්පහ පදිංචි පට්ටියගේ සහන් ප්‍රසාද් යන අය බන්ධනදායි වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2007 ක් වූ පෙබරවාරි මස 21 වැනි දින ප. ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.*– ගම්පහ නගර මධ්‍යයේ සිට ඔරුතොට පාරේ සැතපුම් 1 1/4 ක් පමණ ගමන්ගෙන බණ්ඩාරනායක මාවතට හැරෙන්න. මෙම පාරේ යාර 600 ක් පමණ ගිය විට වම් දෙසින් හමුවන බොරළු පාරට පිවිස යාර 300 ක් පමණ ගමන් කළ විට මෙම මාර්ගයේ දකුණු දෙසින් පාරට මායිම්ව අදාළ දේපළ පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.09.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රය ද*, 2006.10.10 වැනි දින ලංකාදීප, ඩේලි මිරර් සහ 2006.10.20 වැනි දින වීරකේසරි යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ලිපිකරු හා ඝෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90%(සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (නීති) සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011-4701256, 011-2456258, 077-7736452.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර, වටපුළුව, මහනුවර.
දුරකතන අංක : 081-2211025 071-4755974, 071-4213497, 071-2755974.
ෆැක්ස් අංකය : 081-2211025.

02-132/1

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0900000191.
ණයකරුගේ සම්පූර්ණ නම-ජාසිංහ පතිරණගේ විජේසිංහ.

(මෙහි මින් මතු බැංකුව යනුවෙන් සඳහන් කරනු ලබන)2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.12.05 වන දින අංක 1318 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.05.04 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ කුරුදුවත්ත, වල්ගම, මාතර යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ජී. පී. ආනන්ද මයා විසින් 2007.02.22 වැනි දින පෙ. ව. 11.00, සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ දාහතරදහස් හත්සිය පහයි ශත දොළහක් (රු. 114,705.12) මුදලක් වර්ෂ 2003.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අසූපන්දහස් හත්සිය අනූදෙකයි ශත එකක (රු. 85,792.01) මුදල ද, 2003.03.31 වැනි දි න දක්වා පොළිය වශයෙන් රුපියල් විසිඅට දහස් නමසිය දහතුනයි ශත එකොළහක් (රු. 28,913.11) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ දාහතරදහස් හත්සිය පහයි ශත දොළහක් (රු. 114,705.12) ද,

(2) එකී රුපියල් අසූපන්දහස් හත්සිය අනූදෙකයි ශත එකක (රු. 85,792.01) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.00% බැගින් වන පොළියක් 2003.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස,

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ගැටමාන්න ග්‍රාමයේ හි පිහිටි ගීගනගේවත්ත දකුණු කොටස නමැති ඉඩමට 1997.05.06 දින එච්. පී. ජී. ජයවර්ධන මානක තැන විසින් මැන සම්පාදිත අංක 2259 පිඹුර ප්‍රකාර ලොට් 01 ට මායිම්, උතුරට : ගීගනගේවත්ත උතුරු කොටස ද, නැගෙනහිරට: බිම්බිරිගත කොරටුව ද, දකුණට : බිඹිරිගහකොරටුව ද, බටහිරට: අත්පිටිය පාර ද, යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දහයයි දශම හතරයි එකක් (අක්. 0, රූ. 1, පර්. 10.41) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද සමග තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 192/76 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2007ක් වූ ජනවාරි මස 19 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-160

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2504400183.
ණයකරුගේ සම්පූර්ණ නම-ආරිය පෙරුම රාජකරුණා සෙනෙවිරත්න
අප්පුහාමිලාගේ දොන් හේමචන්ද්‍ර රාජකරුණා
සහ දෙහිවෙදගේ බේබිනෝනා.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන)2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.08.11 වන දින අංක 1,455 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.09.15 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල් " පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 83/5,බෝමලුව පාර, වටපුළුව, මහනුවර යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය මයා විසින් 2007.02.23 වැනි දින පෙ. ව. 11.00, සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස් දෙදහස් හැත්තෑතුනයි ශත හැත්තෑතුනක් (රු. 242,073.73) මුදලක් වර්ෂ 2004.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අනූපන්දහස් හයසිය තුනයි ශත අසූහතක (රු. 195,603.87) මුදල ද, 2004.07.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් හතලිස්හය දහස් හාරසිය හැට නමයයි ශත අසූ හයක් (රු. 46,469.86) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතලිස් දෙදහස් හැත්තෑතුනයි ශත හැත්තෑතුනක් (රු. 242,073.73) ද,

(2) එකී රුපියල් එක් ලක්ෂ අනූපන්දහස් හයසිය තුනයි ශත අසූහතක (රු. 195,603.87) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.50% බැගින් වන පොළියක් 2004.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස,

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, තුන්කෝරලේ පනාවල කෝරළේ, දෙහිඹිවිට ප්‍රාදේශීය සභා සීමාවේ, මාදොළ ග්‍රාමයෙහි පිහිටි හෙලරිෆීල්ඩ් එස්ටේට් නැමැති ඉඩමට 1994.11.14 දින එන්. පී. ඇල්විටිගල මානක තැන විසින් මැන සම්පාදිත අංක 546 පිඹුර ප්‍රකාර ලොට් 299 ට මායිම් උතුරට : ලොට් 300 ද, නැගෙනහිරට : පිඹුරු අංක 426 ඒ ලොට් 2 හි ඉතිරි කොටස ද, දකුණට : ලොට් 298 ද, බටහිරට : ලොට් 271 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම පහයි බිංදුවක (අක්. 0 රූඩ්. 0 පර්. 14.50) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 67/48 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2007ක් වූ ජනවාරි මස 19 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

02-161

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

ඩබ්ලිව්. එල්. එල්. රත්නසීලි සහ පී. වී. ටී. ප්‍රනාන්දු -
ගිණුම් අංක : 0002 5005 5218.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.01.20 වන දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2007.01.26 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2006.10.05 වන දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" යන දිනපතා පුවත්පත්වල ද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හත් ලක්ෂ අසූනව දහස් තුන්සිය විසි පහකුත් ශත එකොලහක (රු. 789,325.11) මුදල ද තවත් රුපියල් හය ලක්ෂ අනූඅට දහස් හතලිස් පහකුත් ශත හැත්තෑවක (රු. 698.045.70) මුදල සඳහා වසරකට සියයට දොළහයි දශම එක (12.1%) බැගින් 2004 ඔක්තෝබර් මස 21 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමඟ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2007.02.21 වැනි දින. පෙ. ව. 11.ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ නැදගමුවේ පිහිටි "ගලබඩවට" නැමැති ඉඩමෙන් බලය ලත් මිනින්දෝරු එස්. පී. එන්. සදගිරි විසින් සාදන ලද 2001 දෙසැම්බර් 19 දාතම හා අංක 436 A දරන පිඹුරේ ලොට් 2 D වශයෙන් ලකුණු කොට දක්වා ඇති ගම්පහ ඉඩම් කාර්යාලයේ A258/250 හි ලියා පදිංචිකර ඇති උතුරට : ලොට් 2 C ද, නැගෙනහිරට: යූ. ඩයස් ගේ ඉඩම ද, දකුණට : මා. සං. අධිකාරියට අයත් පාර ද සහ බටහිරට: ලොට් 2 C ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම දෙකයි දෙකක් (අක්. 0, රූඩ්.0, පර්. 16.22) වූ බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියළු දේ සමහය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

02-144

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය - 261/2000.

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.10.13 දිනැති අංක 1,467 දරන *ගැසට් පත්‍රයේ* හා 2006.10.09 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පල කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ ම 2007.03.29 වෙනි දින පෙ.ව. 10.30 ට කුලියාපිටිය, පන්නල පාර, අංක 56 හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියස් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිල්ලි හත්පත්තුවේ තිරගන්දාහේ කෝරළයේ, කුරුණෑගල මහ නගර සභා සීමාවේ, පොල්අත්තපිටිය හි පිහිටි පොල්අත්තපිටියවත්ත *හෙවත්* සේවක්කවැව නැමැති ඉඩම, බලයලත් මිනින්දෝරු සරත් වෙලගෙදර විසින් සාදන ලද 1999.12.02 දිනැති අංක 3645 දරන පිඹුරේ ලොට් 6 වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම් කැබැල්ල,

වයඹට සහ ඊසානට : වරිපනම් අංක 35, ගාමිණී පෙරේරා හිමිකම් කියන ඉඩම ද,

| | | |
|---|---|---|
| නැගෙනහිරට | : | ගුණසිරි හිමිකම් කියන ඉඩම ද, |
| නිරිතදිගට හා ගිනිකොණට | : | පියසිංහ හිමිකම් කියන ඉඩම නමුත් වඩා නිවැරදි, |
| නිරිතදිගට | : | ලොට් 7 ද, |
| බස්නාහිරට | : | අඩි 15ක් පළල පාර වශයෙන් විස්තර කළ ලොට් 3 ද, |

මායිම්ව පර්චස් නවයයි දශම පහක (අ 0 රූ. 0 පර්. 9.5) බිම් ප්‍රමාණය සමඟ එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ පිහිටි සියලු දේ සමඟ එකී පිඹුරේ ලොට් 3 වශයෙන් විස්තර කළ පොදු පාර පාවිච්චි කිරීමේ හා නඩත්තු කිරීමේ අයිතිය ද වෙ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1420/137 හි ලියාපදිංචි කර ඇත.

02. එකී පොල්අත්තපිටිය හි පිහිටි පොල්අත්තපිටියවත්ත *හෙවත්* සේවක්කවැව නමැති ඉඩම එකී අංක 3645 දරන පිඹුරේ ලොට් 7 වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම් කැබැල්ල..

| | | |
|---|---|---|
| ඊසානට හා වයඹට | : | වරිපනම් අංක 35 ගාමිණී පෙරේරා හිමිකම් කියන ඉඩම නමුත් වඩා නිවැරදි ඊසානට එකී අංක 3645 දරන පිඹුරේ ලොට් 6 ද, |
| නිරිතදිගට සහ ගිනිකොණට | : | එම්. පියසිංහ හිමිකම් කියන ඉඩම නමුත් වඩා නිවැරදි |
| ගිණිකොනට | : | කාණුවක් ලෙස විස්තර කළ ලොට් 8 ද, |
| නිරිතදිගට | : | එම්. පියසිංහගේ ඉඩම ද, |
| බස්නාහිරට | : | කාණුවක් ලෙස විස්තර කළ ලොට් 9 සහ අඩි 15 ක් පළල පාරක් ලෙස විස්තර කළ ලොට් 3 ද, |

මායිම්ව පර්චස් අටයි දශම තුනක (අ.0 රූ.0 පර්. 8.3) බිම් ප්‍රමාණය සමඟ එහි පිහිටි සියලු දේ සහ එකී පිඹුරේ ලොට් 3 ලෙස විස්තර කළ පොදු පාර පාවිච්චි කිරීමේ හා නඩත්තු කිරීමේ අයිතිය ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1420/138 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. ජී. ජයවීර,
කළමනාකරු.

ලංකා බැංකුව,
2 වැනි නගර ශාඛාව,
කුරුණෑගල.

02-157

## ලංකා බැංකුව

### ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරිය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥා පනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.02.13 දිනැති අංක 1,328 දරන *ගැසට් පත්‍රයේ* හා 2004.02.03 දිනැති දිනමිණ, තිනකරන්, ඩේලිනිවුස් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුළු මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයෙහි විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දීම 2007.02.24 වැනි දින පෙ. ව. 11.30 ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 මහානාම ඩ්‍රයිව් හි පදිංචි ආර්. එස්. මහානාම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, මැද පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ, කොස්කඳවල ග්‍රාමයේ පිහිටි හොරගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු යූ. එම්. ආරියසේන විසින් සාදන ලද 1996 මැයි 25 දිනැති අංක 645 දරන පිඹුරේ විස්තර කළ ලොට් බී 3 වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම් කැබැල්ල, උතුරට: ලොට් බී 2 ද, නැගෙනහිරට : අංක 756 දරන පිඹුරේ ලොට් 1 හි ඉතිරි කොටස ද, දකුණට: පාර ද, බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද, මායිම් එකී අංක 645 දරන පිඹුර අනුව පර්චස් විසි පහක් (අ.0 රූ.0,පර්. 25) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හයයි තුනයි තුනක (හෙක්. 0.0633) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමඟ එහි පිහිටි සියලු දේ වේ.

එකී ඉඩම් කැබැල්ල පහත විස්තර කළ ඉඩමෙන් බෙදන ලද්දා වූ නිශ්චිත කොටසකි.

එකී කොස්කඳවල හි පිහිටි හොරගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු යූ. එම්. ආරියසේන විසින් සාදන ලද 1995 සැප්තැම්බර් 17 දිනැති අංක 474 දරන පිඹුරේ ලොට් බී වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම් කැබැල්ල, උතුරට: ලොට් ඒ ද, නැගෙනහිරට: අංක 756 දරන පිඹුරේ ලොට් 1 හි ඉතිරි කොටස ද, දකුණට: පාර ද, බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද, මායිම්ව එකී අංක 474 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් තිහක (අ. 0 රූ.1 පර්.30) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම එකයි හතයි හතයි එකක (හෙක්. 0.01771) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමඟ එහි පිහිටි සියලු දේ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 450/184 හි ලියාපදිංචි කර ඇත.

ජේ. එම්. ඒ. ආරියරත්න,
ජ්‍යෝෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණී ශාඛාව,
ගම්පහ.

02-156

---

## නිවැරදි කිරීමයි

### ලංකා බැංකුව

2007.01.19 වැනි දින අංක 1481 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* I වැනි කොටස (II ආ) ජෙදය -පළ කිරීම් හි වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් යටතේ අංක 01-329 දරන දැන්වීමෙහි සඳහන් මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහ නගර සභා සීමාව තුළ මහදෙවට පාරේ පිහිටි "ගෙදරවත්ත යැයි හඳුන්වනු ලබන ඉඩමෙන් කොටසක්" වෙන්දේසි කරන දිනය "2007.02.28" ලෙස පළ වී ඇත. එම දිනය "2007.02.08" ලෙස නිවැරදි විය යුතුය.

ඊ. එම්. බී. ඒකනායක,
කළමනාකරු.

ලංකා බැංකුව,
වත්තේගම.

01-329

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* - (වාර්ෂික)

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ රු. | ශ. | තැපැල් ගාස්තුව (මෙරට) රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| පෙබරවාරි | 2007.02.02 | සිකුරාදා | 2007.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.09 | සිකුරාදා | 2007.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.15 | බ්‍රහස්පතින්දා | 2007.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.23 | සිකුරාදා | 2007.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2007.03.02 | සිකුරාදා | 2007.02.15 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2007.03.09 | සිකුරාදා | 2007.02.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.16 | සිකුරාදා | 2007.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.23 | සිකුරාදා | 2007.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.30 | සිකුරාදා | 2007.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2007.04.05 | බ්‍රහස්පතින්දා | 2007.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.04.12 | බ්‍රහස්පතින්දා | 2007.03.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.04.20 | සිකුරාදා | 2007.04.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2007.04.27 | සිකුරාදා | 2007.04.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.